සියලුම හිමිකම් ඇවිරිණි ]
All Rights Reserved ]

ඌව පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව - බදුල්ල.
Uva Provincial Education Department – Badulla.

අධ්‍යයන පොදු සහතික පත්‍ර උසස් පෙළ විභාගය - 2023 පෙරහුරු පරීක්ෂණය
General Certificate of Education (Advanced Level) Examination - 2023 Practice Test

ගෘහ ආර්ථික විද්‍යාව - I
Home Economics - I

28 S I

13 ශ්‍රේණිය

කාලය : පැය දෙකයි
Time : Two hours

*උපදෙස් :*

- **සියලු ම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.**
- උත්තර පත්‍රයේ නියමිත ස්ථානයේ විභාග අංකය ලියන්න.
- **01** සිට **50** තෙක් එක් එක් ප්‍රශ්නයට **(1), (2), (3), (4), (5)** යන පිළිතුරුවලින් **නිවැරදි** හෝ ඉතාමත් ගැළපෙන හෝ පිළිතුර තෝරාගෙන, එය උත්තර පත්‍රයේ පිටුපස දැක්වෙන උපදෙස් පරිදි **කතිරයක් (X)** යොදා දක්වන්න.

01. නිර්මිත පරිසරයක් සකස් කිරීමේදී සලකා බැලිය යුතු උපයෝගිතා සාධකයක් වනුයේ,
(1) සංකල්පය (2) සන්දර්භය (3) කලාත්මක බව
(4) ආර්ථික පරිසරය (5) භාවිතය හා භාවිතා කරන්නන්

02. පහත සඳහන් ප්‍රකාශ අතුරින් වැරදි ප්‍රකාශය තෝරන්න.
(1) වර්ණ චක්‍රය සෑදී ඇත්තේ වර්ණ නාමයෙන් හැඳින්වෙන වර්ණ වලිනි.
(2) වර්ණ චක්‍රයට අයත් නොවන සුදු, කළු හා ඇපල් වයිට් යන වර්ණ උදාසීන වර්ණ වේ.
(3) වර්ණයක දීප්තිමත් බව හෝ අඳුරු බව තීව්‍රතාවයයි.
(4) එකම ලක්ෂණය නැවත නැවත පෙන්නුම් කිරීම ආසාත්මක රිද්මයයි.
(5) නොසන්සුන් බව, කලබලකාරීබව, විකර්ණාකාර රේඛා මගින් ඇති කරන හැඟීමකි.

03. ගොඩනැගිලි නිර්මාණයේ දී ප්‍රධාන දිශා සඳහා ගඩොල් බිත්ති බහුලව යොදා ගැනීම සිදු වේ. මීට හේතු වනුයේ,
(1) අධික හිරු රශ්මියට ඔරොත්තු දීම හා සවිවරභාවය.
(2) අධික හිරු රශ්මියට ඔරොත්තු නොදීම හා සවිවර භාවයයි.
(3) ගඩොල් මිල අඩුවීම හා උෂ්ණත්වයට ඔරොත්තු දීමය.
(4) බහුලව සපයාගත හැකි වීම හා නිර්මාණ ගොඩනැඟීමට හැකි වීමය.
(5) ස්වාභාවික ආලෝකය හා වාතාශ්‍රය පහසුවෙන් ලැබීමත්ය.

04. මේ අතුරෙන් හරිත තිරසාර නිවසක් සඳහා නුසුදුසු වන්නේ කුමක් ද?
(1) විද්‍යුත් ශක්තිය වෙනුවට සූර්ය බලශක්තිය භාවිත කිරීම.
(2) වැසි ජලය රැස් කර, ගෙවතු වගාව සඳහා යොදා ගැනීම.
(3) LED විදුලි පහන් වෙනුවට සූත්‍රිකා සහිත විදුලි පහන් භාවිතා කිරීම.
(4) විදුලි පංකා ක්‍රියා කරවීම වෙනුවට ජනේල විවෘතව තැබීම.
(5) කෘත්‍රිම ආලෝකය වෙනුවට ස්වභාවික ආලෝකය ලබා ගැනීම.

05. ($C_6 H_{10} O_5$) සූත්‍රය ඇතුළත් කාබෝහයිඩ්‍රේට් කාණ්ඩය තෝරන්න.
(1) ග්ලූකෝස්, ලැක්ටෝස්, සුක්‍රෝස්
(2) සෙලියුලෝස්, ග්ලයිකෝජන්, ෆෲක්ටෝස්
(3) ග්ලූකෝස්, පිෂ්ටය, ග්ලයිකෝජන්
(4) පිෂ්ටය, සෙලියුලෝස්, ග්ලයිකෝජන්
(5) ලැක්ටෝස්, සුක්‍රෝස්, ෆෲක්ටෝස්

06. ප්‍රෝටීන් පිළිබඳ අසත්‍ය ප්‍රකාශය තෝරන්න.
(1) ශාක ප්‍රෝටීන හා සත්ත්ව ප්‍රෝටීන එකිනෙකින් වෙනස් වේ.
(2) සත්ත්ව ප්‍රෝටීනවල ගුණාත්මකභාවය වැඩිය.
(3) තිරිඟු හා සහල්වල ලයිසින් හිඟය.
(4) මුං ඇට වැනි රනිලවල ට්‍රිප්ටොපෑන් හා මෙතයොනින් හිඟය.
(5) ආහාරයේ අඩංගු අමතර ප්‍රෝටීන ශරීරයේ සංචිත කර ගත හැකිය.

07. මහා පෝෂක මගින් ලබා ගන්නා ශක්තිය පිළිබඳව තොරතුරු කිහිපයක් පහත දැක්වේ.
දිවා ආහාර වේලක කාබෝහයිඩ්‍රේට 200g ක් ද, ප්‍රෝටීන් 40g ක් ද මේද 10g ක් ද අඩංගු විය.
මෙම ආහාර වේලෙන් සපයන ශක්ති ප්‍රමාණය කිලෝ කැලරි කොපමණ ද?
(1) කිලෝ කැලරි 1000 කි. (2) කිලෝ කැලරි 750 කි. (3) කිලෝ කැලරි 900 කි.
(4) කිලෝ කැලරි 1090 කි. (5) කිලෝ කැලරි 1150 කි.

08. මේද අම්ලයේ හයිඩ්‍රොකාබන් දාමයේ ඒක බන්ධන පමණක් අඩංගු මේද අම්ලයකි.
(1) ඔලෙයික් අම්ලය (2) ලිනොලෙනික් අම්ලය (3) ලිනොලෙයික් අම්ලය
(4) ඇරකිඩොනික් අම්ලය (5) ස්ටියරික් අම්ලය

09. ශිෂ්‍යාවක් විසින් ධාන්‍ය හා සම්බන්ධව ලියන ලද සටහනකින් උපුටාගත් වැකි කිහිපයක් පහත දැක්වේ.
A. ධාන්‍ය වර්ග ආහාර පිරමීඩයේ පහළින්ම දක්වා ඇත.
B. සිරුරට දෛනිකව අවශ්‍ය ශක්තිය සපයන හොඳම ප්‍රභවයක් වේ.
C. මේදය බහුලව අඩංගුය.
D. නිවුඩ්ඩෙහි විටමින් හා ඛණිජ අඩංගු වේ.
E. තන්තු අන්තර්ගත වීම නිසා ග්ලූකෝස් හා කොලෙස්ටරෝල් රුධිරයට අවශෝෂණය වීම වේගවත් වේ.

මේවා අතුරින් නිවැරදි ප්‍රකාශ වනුයේ,

(1) A, B සහ D ය. (2) A, D සහ E ය. (3) B, C සහ D ය.
(4) A, C සහ D ය. (5) C, D සහ E ය.

10. පහත කරුණු සලකන්න.
- ප්‍රතිඔක්සිකාරකයකි.
- තුවාල සුවවීමට උපකාරි වේ.
- ප්‍රතිශක්තිය ලබා දේ.
- යකඩ අවශෝෂණය පහසු කරයි.

මෙම කරුණු සියල්ලටම සම්බන්ධ විටමිනය වනුයේ,

(1) විටමින් A ය. (2) විටමින් $B_1$ ය. (3) විටමින් C ය.
(4) විටමින් D ය. (5) විටමින් E ය.

11. ප්‍රෝටීන් මත ක්‍රියාකරන එන්සයිම කාණ්ඩය වනුයේ,
(1) ඇමයිලේස්, රෙනින් සහ ට්‍රිප්සීන්ය. (2) පෙප්ටිඩේස්, ලයිපේස් සහ පෙප්සීන්ය.
(3) පෙප්සීන්, ඇමයිලේස් සහ ට්‍රිප්සීන්ය. (4) රෙනින්, පෙප්ටිඩේස් සහ ඇමයිලේස්ය.
(5) පෙප්සීන්, ට්‍රිප්සීන් සහ පෙප්ටිඩේස්ය.

12. පැන්ටතොනික්, ඇඩිනොසීන් හා ග්ලූටමික් අම්ලය ලෙස රසායනික නම කරන B කාණ්ඩයේ විටමින් වන්නේ,
(1) විටමින් $B_2$, විටමින් $B_4$, විටමින් $B_5$ (2) විටමින් $B_5$, විටමින් $B_8$, විටමින් $B_6$
(3) විටමින් $B_5$, විටමින් $B_8$, විටමින් $B_{11}$ (4) විටමින් $B_{10}$, විටමින් $B_{12}$, විටමින් $B_{11}$
(5) විටමින් $B_4$, විටමින් $B_7$, විටමින් $B_8$

13. පහත සඳහන් ප්‍රකාශ අතුරෙන් ජලයෙහි කෘත්‍යයක් නොවන්නේ කුමක් ද?
(1) ශරීර උෂ්ණත්වය සමනය කරයි.
(2) පෝෂ්‍ය පදාර්ථ ජීර්ණය සහ අවශෝෂණය සඳහා දායක වෙයි.
(3) සිරුරේ විද්‍යුත් විච්ඡේද්‍ය සමතුලිතතාව පවත්වා ගනියි.
(4) පටකවල ස්ථායිතාව පාලනය කරයි.
(5) සිරුරේ අතිරික්ත විටමින් E සහ K බැහැර කිරීම සඳහා ක්‍රියා කරයි.

14. ට්‍රාන්ස් මේද අම්ල අඩංගු ආහාර ඇතුළත් කාණ්ඩය වනුයේ,
(1) කිරි, එළවළු, පේස්ට්‍රි හා මාළුය.
(2) පැටිස්, ක්‍රීම් බනිස් හා චයිනීස් රෝල්ස්ය.
(3) පෆ් පේස්ට්‍රි, මාළු පාන් හා කිරිය.
(4) පලතුරු, මස් හා මාළුය.
(5) පෆ් පේස්ට්‍රි, මාළු පාන් හා කිරිය.

15. සුක්‍රෝස්, ආම්ලික හෝ විජලන තත්ත්ව ඇති විට ඉහළ උෂ්ණත්වය හමුවේ ප්‍රතික්‍රියා මාලාවකට ලක්වී තද දුඹුරු පැහැවීම.
(1) මෙලාඩ් ප්‍රතික්‍රියාවයි.
(2) කැරමලීකරණයයි.
(3) දුඹුරු වීමේ ප්‍රතික්‍රියාවයි.
(4) එන්සයිමීය දුඹුරු වීමයි.
(5) එන්සයිමීය නොවන දුඹුරු වීමයි.

16. වෛද්‍ය සායනයේ දී අචිනිට උසට සරිලන බර ඇතැයි වෛද්‍යවරයා පවසා ඇත. එසේ නම් ඇයගේ ශරීර ස්කන්ධ දර්ශකය (BMI) විය හැක්කේ,
(1) 175 කි. (2) 18.5 – 24.9 (3) 165 – 175 (4) 30 ට වැඩි (5) 25 – 30

17. යකඩ ඌනතාවට හේතුවන කරුණක් නොවන්නේ,
(1) ෆයිටික් අම්ලය අඩංගු ආහාර පරිභෝජනය කිරීමයි.
(2) පරපෝෂිත ආසාදන තිබීමයි.
(3) ආහාර වේලවලට ආසන්නව තේ පානය කිරීමයි.
(4) සිරුර විජලනයට පත්වීමයි.
(5) ආමාශයික තුවාල ඇති වීමයි.

18. ආකලන ද්‍රව්‍ය අතුරින් මෘදු කාරක සනයට අයත් වන්නේ,
(1) පොල්, පොල් කිරි, කබලේ බැදගත් පොල්, බීජ හා අල වර්ග
(2) විනාකිරි, ලුණු, සීනි
(3) සැකරින්, මොනොසෝඩියම් ග්ලූටමේට්
(4) විනාකිරි, දෙහි, සියඹලා, බිලිං, ගොරකා, ඇඹරැල්ලා
(5) පැපොල්, පෙරුම්කායම්, මුදවාපු කිරි, විනාකිරි, දෙහි ඇඹුල්, සියඹලා, ගොරකා

19. ආමාශයික ප්‍රදාහය ඇති වීමට බලපාන බැක්ටීරියාව
(1) එක්වේරිචියක කොලයි
(2) හෙලිකොබැක්ටර් ෆයිලෝරි
(3) ලැක්ටො බැසිලස් බල්ගර්කස්
(4) ස්ටෙප්ටකොකස් ලැක්ටිස්
(5) සියුඩමොනාස්

20. රුධිර නාලවල මේද තැන්පත් වීම හා පිළිකා ඇතිවීමේ අවධානම අඩු කිරීමට උදව් වන විටමිනය වන්නේ,
(1) විටමින් A (2) විටමින් B (3) විටමින් C (4) විටමින් D (5) විටමින් K

21. විවිධ ඇසුරුම් ද්‍රව්‍ය ඒකාබද්ධ කර ඇති ටෙට්‍රාපැක් ඇසුරුමේ ඔක්සිජන් වායුවට හා ආලෝකයට ප්‍රතිරෝධී පටලයක් ලෙස ක්‍රියා කරන ස්ථරය වන්නේ,
(1) අභ්‍යන්තර පොලිතීන් පටලය
(2) ඇලුමිනියම් පටලය
(3) කඩදාසි ස්ථරය
(4) බාහිර පොලිතීන් පටලය
(5) ඉහත කී සියල්ලම

22. ක්ෂුද්‍රජීවීන් මගින් ආහාර නරක්වීම කෙරෙහි බලපාන බාහිර සාධක දෙකක් වන්නේ,
(1) තෙතමනය සහ pH අගයය.
(2) සාපේක්ෂ ආර්ද්‍රතාව සහ පෝෂක ද්‍රව්‍ය ප්‍රමාණයය.
(3) වායුගෝලීය ඔක්සිජන් සහ සාපේක්ෂ ආර්ද්‍රතාවය.
(4) වායුගෝලීය ඔක්සිජන් සහ pH අගයය.
(5) තෙතමනය සහ පෝෂක ද්‍රව්‍ය ප්‍රමාණයය.

23. ෂූ පේස්ට්‍රිය භාවිත කර සාදනු ලබන ආහාර වර්ග මොනවාද?
(1) පේස්ට්‍රි බාස්කට් සහ ඉක්ලෙයාස්
(2) පැටිස් සහ මාළු පාන්
(3) හොට්ඩොග්ස් සහ මාළු පාන්
(4) ඉක්ලෙයාස් සහ ක්‍රීම් බනිස්
(5) මාළු පාන් සහ ප්‍රොපට් රෝල්ස්

24. කෙඳි වර්ගීකරණයට අනුව නිවැරදි ප්‍රකාශය මින් කුමක් ද?
(1) රන් සහ රිදී ඛණිජමය කෙඳි වර්ග දෙකකි.
(2) සත්ත්වමය කෙඳි, ප්‍රෝටීන් කෙඳි වර්ග වේ.
(3) ඇස්බැස්ටෝස් මිනිසා විසින් නිෂ්පාදිත කෙන්දකි.
(4) නයිලෝන්, පොලිඑතලීන් කාණ්ඩයේ කෘතිම කෙන්දකි.
(5) සෙයුලෝස්, පුනර්ජනිත කෙඳිවල අනිවාර්ය සංඝටකයකි.

25. කෙඳි වර්ග දෙකක් මිශ්‍ර කර නිෂ්පාදිත රෙදි නියැදියක් පිළිස්සූ විට අළු පැහැති අළු සහ කුඩුවන සුළු ප්ලාස්ටික් පබළු මෙන් දිස් වූ ද්‍රව්‍ය ඉතිරි විය. මෙම නියැදියේ අඩංගු කෙඳි වර්ග දෙක වනුයේ,
(1) කපු සහ සේදය.
(2) කපු සහ නයිලෝන්ය.
(3) නයිලෝන් සහ සේදය.
(4) කපු සහ සෙලියුලෝස් ඇසිටේට්ය.
(5) සේද සහ සෙලියුලෝස් ඇසිටේට්ය.

26. වාණිජ මැහුම් ක්‍රම පිළිබඳ නිවැරදි ප්‍රකාශය වනුයේ මින් කුමක් ද?
(1) තනි නූලේ දම්වැල් මැස්ම සුලභව භාවිතා වන ස්ථිර මැස්මක් වේ.
(2) වැසුණු දම්වැල් මැස්ම 500 වර්ගයට අයත්ය.
(3) නොපෙනෙන මැස්ම මැසීමට වක් වූ ඉඳිකටුවක් භාවිතා වේ.
(4) අගුලු මැස්ම, මතු පිටින් සහ නොපිටින් දෙආකාරයකට දිස්වේ.
(5) ඇඳුම් අලුත්වැඩියා කිරීම සඳහා අත්මැස්ම භාවිත වේ.

27. රෙද්දක් මසර කිරීමෙන් ඇතිවන වාසියක් නොවන්නේ,
(1) ශක්තිමත් බව වැඩිදියුණු වීම.
(2) මතුපිට දීප්තිය /ඔපය වැඩි වීම.
(3) අවශෝෂකතාව වැඩි වීම.
(4) මැදීමේ පහසුව
(5) ඇදෙන සුළු බව

28. ඇඳුම් මෝස්තර සටහන් නිර්මාණ ශිල්පියෙකු විසින් කර්මාන්ත ශාලාව වෙත ලබා දෙන සටහන හඳුන්වන්නේ,
(1) මෝස්තරයේ පිරිසැලසුම් සටහන
(2) මෝස්තරයේ ජ්‍යාමිතික සටහන
(3) මෝස්තරයේ පතරොම් සටහන
(4) මෝස්තරයේ මාකර් සටහන
(5) ඉහත කිසිවක් නොවේ.

29. පහත A හා B රූප සටහන් වලින් දැක්වෙන වියමන් ක්‍රම අනුපිළිවෙළින් දක්වා ඇති පිළිතුර තෝරන්න.


A රූප සටහන


B රූප සටහන

(1) හිරි වියමන හා ජටා වියමන
(2) දික්දාර වියමන හා හිරි වියමනය.
(3) හරස්දාර වියමන හා වාම් වියමනය.
(4) දික්දාර වියමන හා ජටා වියමනය.
(5) හරස්දාර වියමන හා දික්දාර වියමනය.

30. රෙද්දක් මත මෝස්තරයක් පිටපත් කරන පින්සල, නූල්, රෝලර් හෝ ස්පොන්ච් භාවිත කර ගනිමින් වර්ණ ගැන්වීම සිදු කරන රෙදි මුද්‍රණ ශිල්පීය ක්‍රමය හඳුන්වනු ලබන්නේ,
(1) අච්චු මුද්‍රණය ලෙසය.
(2) ස්ටෙන්සිල් මුද්‍රණය ලෙසය.
(3) තිර රාමු මුද්‍රණය ලෙසය.
(4) පින්තාරු මුද්‍රණය ලෙසය.
(5) බතික් මුද්‍රණය ලෙසය.

31. මැසීමේ ශිල්පීය ක්‍රමයක් නොවන්නේ,
(1) සැන ගාංචු ඇල්ලීම
(2) බඳන යෙදීම
(3) විවර පියවීම
(4) හීන් නූල් දිවවීම
(5) රේන්ද ඇල්ලීම

32. අන්තර් පුද්ගල සබඳතා වර්ධනය කර ගැනීමට වැදගත් නොවන කුසලතාවයක් වන්නේ,
(1) ගැටළු විසඳීමට හා නිවැරදි තීරණ ගැනීමට ඇති හැකියාව.
(2) සංසන්ධි කථිකාව
(3) තීරණ ගැනීමේදී ධන බලය, දේශපාලන බලය හෝ වෙනත් කරුණු කෙරෙහි අවධානය යොමු කිරීම.
(4) අවාචික සන්නිවේදනය.
(5) භාෂා දැනුම හා සන්නිවේදන හැකියාව.

33. වාචික සන්නිවේදනය හා සම්බන්ධ නිවැරදි ප්‍රකාශය මින් කුමක් ද?
(1) තහවුරු කර ගැනීමේ හැකියාව වැඩි වීම.
(2) ප්‍රතිචාර ලැබීම ප්‍රමාද වීම.
(3) නැවත නැවත අධ්‍යයනය කිරීමට පහසු වීම.
(4) අන්‍යයන්ගේ අවධානය යොමු කර ගත හැකි වීම.
(5) අපැහැදිලි අවස්ථා පැහැදිලි කර ගැනීමට පහසු වීම.

34. පහත සඳහන් සිද්ධීන් අතුරෙන් "සංසන්දි කතිකාවත" පෙන්නුම් කරනුයේ කුමක් ද?
(1) පන්ති නායකයාගේ අණ අන් අය පිළිපැදීම.
(2) වැඩි පිරිසකගේ මතයට අන් අය අවනත වීම.
(3) විරුද්ධ මත ඇති දෙපිරිසක් එකඟතාවයකට පැමිණීම.
(4) සිසුන් දෙදෙනෙකුගේ ගැටුමක් ගුරුවරයා මැදිහත් වී විසඳීම.
(5) කණ්ඩායමක සාමාජිකයින්ගේ මතයට නායකයා විරුද්ධ වීම.

35. මේ අතුරෙන් සංචරණය පිළිබඳ සත්‍ය ප්‍රකාශය කුමක් ද?
(1) ස්වාභාවධර්ම සංචරණය රුදෙස් සංචරණය නමින් ද හඳුන්වයි.
(2) විකල්ප සංචරණය මගින් නව්‍ය අත්දැකීම් ලබා ගැනීමට හැකි වේ.
(3) අභ්‍යන්තර සංචරණය රටක නේවාසික ආගන්තුකයින්ට පමණක් සීමා වේ.
(4) කිමිදීම සහ මුහුදු සුළං පහස විඳීම ප්‍රයාන සංචරණයට අයත් ක්‍රියාකාරකම් දෙකකි.
(5) ගොවිපොළක් තුළ නේවාසිකව ගත කිරීම ස්වභාවධර්ම සංචරණයට උදාහරණයකි.

36. සංචාරක කර්මාන්තය හා සම්බන්ධ වැරදි ප්‍රකාශය කුමක් ද?
(1) සංචාරක බංගලා ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය යටතේ ලියාපදිංචි කළ යුතුය.
(2) වර්ෂ 2016 වන විට ශ්‍රී ලංකාවේ සමස්ත සංචාරක ප්‍රවාහනයෙන් 16% ක් ඉන්දියානුවන්ය.
(3) රක්ෂණ ආයතන මගින් සංචාරක කර්මාන්තයට අදාළ උපකාරක සේවාවන් සපයනු ලැබේ.
(4) විවිධ තේමා පසුබිම් කරගත් බුටික් (boutique) හෝටල් ආදේශක නවාතැන් අංශයට අයත් ය.
(5) වර්ෂ 2015 දී ශ්‍රී ලංකාවේ සංචාරක කර්මාන්තයේ දෙවන විශාලතම ප්‍රභවය චීනය ලෙස වාර්තා විය.

37. ජල පරිහරණය හා සම්බන්ධ ප්‍රකාශ කිහිපයක් පහත දැක්වේ. මින් නිරවද්‍ය ප්‍රකාශය කුමක් ද?
(1) රෙදි සේදීමට යොදාගත් ජලය පූතික ටැංකියකට බැහැර කළ යුතුය.
(2) වැසි ජලයෙහි කඨිනත්වය නිසා රෙදි සේදීමේ ක්‍රියාවලියට යෝග්‍ය නොවේ.
(3) රෙදි සෝදන යන්ත්‍ර භාවිතයේ දී අඩු රෙදි ප්‍රමාණයක් යොදා ක්‍රියාත්මක කිරීම යහපත් පුරුද්දකි.
(4) ජලයෙහි වෙසෙන ඊ කෝලයි (E Coly) ප්‍රමාණය මැනීමෙන් පානය සඳහා එහි යෝග්‍යතාව තීරණය කර ගත හැකි වේ.
(5) මිනිස් හා සත්ත්ව මළ සමඟ ජලයට එක්වන ක්ෂුද්‍ර ජීවීන් නිසා මැලේරියාව සහ පිටගැස්ම ඇති විය හැකිය.

38. ශ්‍රී ලංකාවේ නළ ජලය භාවිත කරන නාගරික ප්‍රදේශවල දිනක ඒක පුද්ගල ජල පරිභෝජනය
(1) ලීටර් 90 – 110 අතර වේ. (2) ලීටර් 90 – 120 අතර වේ. (3) ලීටර් 105 – 110 අතර වේ.
(4) ලීටර් 130 – 150 අතර වේ. (5) ලීටර් 120 – 140 අතර වේ.

39. ශ්‍රී ලංකාව තුළ විදුලි බිල්පතක් සැකසීමේ යාන්ත්‍රණය සිදු කරනු ලබනුයේ,
(1) මහජන උපයෝගිතා කොමිසම මගිනි. (2) ශ්‍රී ලංකා විදුලිබල මණ්ඩලය මගිනි.
(3) ප්‍රාදේශීය සභාව මගිනි. (4) නගර සභාව මගිනි.
(5) මධ්‍යම පරිසර අධිකාරිය මගිනි.

40. විදුලි සැපයුමක දී සම්මත මිනුමක් ලෙස ඇම්පියරය භාවිත කරනු ලබන්නේ,
(1) ප්‍රතිරෝධය මැනීම සඳහා ය. (2) ක්ෂමතාව මැනීම සඳහා ය.
(3) විද්‍යුත් ශක්තිය මැනීම සඳහා ය. (4) ධාරාව මැනීමේ සම්මත ඒකකය ලෙසය.
(5) විභව අන්තරය මැනීමේ ඒකකය ලෙසය.

41. ග්ලැසියර දියවීම නිසා මුහුදු ජල මට්ටම ඉහළ යයි. මෙයට ප්‍රධානම හේතු වන්නේ,
(1) පාංශු ඛාදනය (2) අධික වර්ෂාපතනය (3) උෂ්ණත්වය වෙනස් වීම
(4) අපද්‍රව්‍ය මුහුදු ජලයට එක්වීම (4) සුළි සුළං තත්ත්වය

42. ගවමස්, පලතුරු, එළවළු, කිරි යන ආහාරවල පා සලකුණු අගයන් පිළිවෙළින් දැක්වෙන්නේ,
(1) 31, 6, 5, 18 (2) 31, 5, 6, 18 (3) 18, 6, 5, 31 (4) 5, 18, 6, 31 (5) 6, 31, 5, 18

43. හරිතාගාර වායු සාන්ද්‍රනය ඉහල යාමට බලපාන මිනිස් ක්‍රියාකාරකමක් වන්නේ,
(1) කසල අවම කිරීම. (2) ඉන්ධන දහනය අවම කිරීම.
(3) පොසිල ඉන්ධන දහනය (4) රුක්රෝපණ වැඩසටහන්
(5) දියුණු පොදු ප්‍රවාහන සේවා ස්ථාපිතය.

44. යොවුන්වියෙහි පසුවන ගැහැණු සහ පිරිමි දරුවන්ගේ කායික වර්ධනය පිළිබඳ නිවැරදි ප්‍රකාශය තෝරන්න.
(1) යොවුන්වියෙහි ආරම්භය එකම වයස් සීමාවක් තුළ සිදු වෙයි.
(2) ස්වරාලය විශාල වීම දක්නට ලැබෙයි.
(3) ප්‍රජනක හෝමෝන ක්‍රියාකාරී වෙයි.
(4) පරිණත ප්‍රජනක සෛල ශරීරයේ ගබඩා කර තබයි.
(5) වයස අවුරුදු 17 දී අස්ථි මේරීම අවසන් වෙයි.

45. නව යෞවනයා තුළ ගැටළු ඇතිවීම කෙරෙහි බලපාන අභ්‍යන්තර සාධක දෙකක් වනුයේ,
(1) අන්තර් පුද්ගල සබඳතා සහ පුද්ගල ආකල්පයයි.
(2) පුද්ගල ආකල්ප සහ තරඟකාරිත්වයයි.
(3) මානසික ශක්තිය සහ අන්තර් පුද්ගල සබඳතායි.
(4) පුද්ගල පෞරුෂය සහ මානසික ශක්තියයි.
(5) තරඟකාරිත්වය සහ පුද්ගල පෞරුෂයයි.

46. යෞවන අවධියේ දැකිය හැකි මානසික ගැටළු පමණක් ඇතුළත් පිළිතුර තෝරන්න.

A - හීනමානය B - වර්ධනය දුර්වලවීම C - සංකාව D - ආතතිය

(1) A හා B පමණි. (2) C හා D පමණි. (3) A, B හා C පමණි.
(4) A, C හා D පමණි. (5) B, C හා D පමණි.

47. "ස්ව සංකල්පය" ගොඩනගා ගැනීමට දරුවන් යොමු කිරීමේ දී වැදගත් වන කරුණක් වන්නේ,
(1) දරුවන්ගේ එදිනෙදා වැඩ කටයුතු වලට වැඩිහිටියන් මැදිහත් වීමයි.
(2) අනෙක් දරුවන්ගේ විවිධ හැකියා හා සංසන්දනය කිරීමයි.
(3) අභියෝග හා ගැටළු වැඩිහිටියන් විසින් විසඳීමයි.
(4) සුළු ජයග්‍රහණයක දී පවා දරුවන් ඇගයීමට ලක් කිරීමයි.
(5) දරුවන්ගේ දුර්වලතා අන් අය ඉදිරියේ පෙන්වා දීමයි.

48. ව්‍යාපාරයක් හා සම්බන්ධ අභ්‍යන්තර ආචාර ධර්මයක් වන්නේ,
(1) සේවක අයිතිවාසිකම් ලබා දීමයි. (2) අලෙවිකරණයයි.
(3) පරිසර සංරක්ෂණයයි. (4) ව්‍යාපාරික නීති අනුගමනයයි.
(5) සාධාරණ මිල ප්‍රතිපත්තියයි.

49. සුළු පරිමාණ ව්‍යාපාරයක ඵලදායිතාව ඉහළ නැංවීම සඳහා අනුගමනය කළ යුතු වන්නේ,
(1) කයිසන් සංකල්පය සහ පංචවිධ සංකල්පයයි.
(2) ශදුඅත (SWOT) විශ්ලේෂණය සහ කයිසන් සංකල්පයයි.
(3) පංචවිධ සංකල්පය සහ තරඟකාරිත්ව විශ්ලේෂණයයි.
(4) ශදුඅත විශ්ලේෂණය සහ පංචවිධ සංකල්පයයි.
(5) තරඟකාරිත්ව විශ්ලේෂණය සහ ශදුඅත විශ්ලේෂණයයි.

50. ව්‍යවසායකයන් තුළ ප්‍රධාන පෙළඹවීම් 3 ක් ඇති බව මැක්ලේලන් විසින් පෙන්වා දී ඇත. ඒවා නම්,
(1) නිෂ්පාදන නවීකරණ සඳහා පෙළඹවීම, ව්‍යාපාර අවස්ථා සඳහා පෙළඹවීම සහ බලය ලබා ගැනීමේ පෙළඹවීමයි.
(2) ප්‍රතිඵල අත්පත් කර ගැනීමේ පෙළඹවීම, ව්‍යාපාර අවස්ථා හඳුනා ගැනීමේ පෙළඹවීම සහ බලය ලබා ගැනීමේ පෙළඹවීමයි.
(3) ප්‍රතිඵල අත්පත් කර ගැනීමේ පෙළඹවීම, බලය ලබා ගැනීමේ පෙළඹවීම සහ අනුබද්ධ වීමේ පෙළඹවීමයි.
(4) අනුබද්ධ වීමේ පෙළඹවීම, නිෂ්පාදන නවීකරණය සඳහා පෙළඹවීම සහ බලය ලබා ගැනීමේ පෙළඹවීමයි.
(5) බලය ලබා ගැනීමේ පෙළඹවීම, ප්‍රතිඵල අත්කර ගැනීමේ පෙළඹවීම සහ ව්‍යාපාර අවස්ථා හඳුනා ගැනීමේ පෙළඹවීමයි.

සියලුම හිමිකම් ඇවිරිණි ]
All Rights Reserved ]

ඌව පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව - බදුල්ල.
Uva Provincial Education Department – Badulla.

අධ්‍යයන පොදු සහතික පත්‍ර උසස් පෙළ විභාගය - 2023 පෙරහුරු පරීක්ෂණය
General Certificate of Education (Advanced Level) Examination - 2023 Practice Test

ගෘහ ආර්ථික විද්‍යාව - II
Home Economics - II

28 S II

13 ශ්‍රේණිය

කාලය : පැය තුනයි.
Time : Three hours

අමතර කියවීම් කාලය : විනාඩි 10 යි.

*උපදෙස් :*
- පළමුවන ප්‍රශ්නය ඇතුළුව ප්‍රශ්න හයකට පිළිතුරු සපයන්න.

(1). (1) නිර්මාණකරණයේ මූලධර්මයක් වන "සමෝධානය" යනුවෙන් කුමක් අදහස් වේද?

(2) ගෘහීය විද්‍යුත් උපකරණයක් නම් කර එහි සිදුවන ශක්ති විපර්යාසය සඳහන් කරන්න.

(3) දුෂ්පෝෂණය යන්න හඳුන්වන්න.

(4) ලිපිඩ හඳුනාගැනීම සඳහා භාවිත කරන රසායනික පරීක්ෂාවක් නම් කර එය සිදු කරන ආකාරය කෙටියෙන් ලියන්න.

(5) ක්‍රියාකාරී ආහාර යන්න හඳුන්වා උදාහරණ දෙකක් දක්වන්න.

(6) ජෛව විද්‍යාත්මක පළිබෝධ පාලනය යනු කුමක් ද?

(7) ලිඛිත සන්නිවේදනයේ වාසියක් හා අවාසියක් සඳහන් කරන්න.

(8) අපද්‍රව්‍ය කළමනාකරණයේ දී භාවිත වන 3R සංකල්පය හඳුන්වන්න.

(9) බතික් කිරීමේ දී තද පැහැයක් ලබා ගැනීම සඳහා ගත හැකි ක්‍රියාමාර්ග දෙකක් දක්වන්න.

(10) ව්‍යවසායකයෙකු සතු ප්‍රධාන කාර්යයන් 4 ක් ලියන්න.

(ලකුණු 2 x 10 = 20)

(2). (1) ගොඩනැගිලි හා නිර්මිත පරිසර නිර්මාණයේ දී සලකා බැලිය යුතු උපයෝගිතා සාධක තුනක් නම් කරන්න. (ලකුණු 03)

(2) නිවාස හෝ කාර්යාල පරිශ්‍ර තුළ ශක්ති පරිභෝජනය අවම කිරීමට භාවිත කළ හැකි උපක්‍රම තුනක් ලියන්න. (ලකුණු 03)

(3) ගෘහස්ථ ජල සංරක්ෂණය සඳහා උපකාරී වන යහපත් පුරුදු පහක් දක්වන්න. (ලකුණු 05)

(4) අනුපූරක හෙවත් ප්‍රතිවිරුද්ධ වර්ණ ගැළපුම උදාහරණ සහිතව හඳුන්වා එය නිදන කාමරයකට යොදා ගන්නා ආකාරය විස්තර කරන්න. (ලකුණු 03)

(3). (1) මේද අම්ලවල ව්‍යුහය අනුව බෙදා දැක්විය හැකි ප්‍රධාන ආකාර දෙකක් නම් කර ඒ එක එකක් සඳහා උදාහරණයක් බැගින් දෙන්න. (ලකුණු 03)

(2) මාස 6 සිට අවුරුද්ද දක්වා දරුවකු ඝන ආහාර වලට හුරු කිරීමේදී සැලකිලිමත් විය යුතු කරුණු හතරක් ලියන්න. (ලකුණු 04)

(3) දරුවන්ගේ පෝෂණ මට්ටම නංවාලීම සඳහා පාසල් මට්ටමෙන් ගෙන ඇති ක්‍රියාමාර්ග හතරක් සඳහන් කරන්න. (ලකුණු 04)

(4) රාත්‍රී ආහාරවේල සඳහා ආදේශ ආහාර වේලක් ඇතුළත්ව ගර්භණී මවකට දිනක ආහාර වේලක බොජුන් පතක් සැලසුම් කරන්න. (ලකුණු 05)

Downloaded from Past Papers Wiki - Most Extensive Wikipedia of Past Papers!

(4). (1) සුබ්‍රිකරණය (බ්ලාන්ච්කරණය) පරිරක්ෂණ ක්‍රමවල දී පූර්ව ප්‍රතිකාරයක් ලෙස යොදා ගනියි.
සුබ්‍රිකරණයෙහි වැදගත්කම සනාථ කිරීමට කරුණු හතරක් ඉදිරිපත් කරන්න. (ලකුණු 04)

(2) ජෑම් සෑදීමේ ක්‍රියාවලියට අදාළ පරිරක්ෂණ උපක්‍රම හා ඒවාට අදාළ මූලධර්ම පැහැදිලි කරන්න. (ලකුණු 04)

(3) ආහාරවල ගුණාත්මක බව වැඩි කිරීම සඳහා යොදා ගන්නා තාක්ෂණික ක්‍රමයක් වන ආහාර ආකලන පිළිබඳව පැහැදිලි කරන්න. (ලකුණු 04)

(4) ආහාර ඇසුරුමක් යනු කුමක්දැයි පැහැදිලි කරන ඇසුරුම් කිරීමේ වැදගත්කම සඳහන් කරන්න. (ලකුණු 04)

(5). (1) නිමි ඇඳුම් කර්මාන්තයේ දී යොදා ගන්නා විවිධ වාණිජ මැහුම් ක්‍රම තුනක් සඳහන් කරන්න. (ලකුණු 03)

(2) නිමි ඇඳුම් කර්මාන්ත ශාලාවක සිදු කෙරෙන නිෂ්පාදන ක්‍රියාවලියේ විවිධ පියවර හයක් සඳහන් කරන්න. (ලකුණු 03)

(3) කෙටි සායෙහි පතරොම නිර්මාණය කිරීමට අවශ්‍ය මිනුම් පහත දැක්වේ.

උකුල මිනුම සෙ.මී. 93

උකුල් එල්ලය සෙ.මී. 21.5

සායෙහි උස සෙ.මී. 55

ඉහත මිනුම් ගණනය කර පතරොම නිර්මාණය කිරීමට අවශ්‍ය රාමුව ගොඩ නඟන්න. (ලකුණු 05)

(4) කෙටි සාය මැසීමේ පියවර අනුපිළිවෙළින් දක්වන්න. (ලකුණු 05)

(6). (1) “සම්පත් අවභාවිතය” යන්න හඳුන්වන්න. (ලකුණු 02)

(2) හරිතාගාර වායු අවම කිරීමට අනුගමනය කළ හැකි ක්‍රියාමාර්ග හතරක් පැහැදිලි කරන්න. (ලකුණු 04)

(3) “විවේකය” ප්‍රතිමෝදනය සඳහා යොදා ගැනීමේදී බලපාන පොදු පහසුකම් හා පුද්ගල ආකල්ප කවරේදැයි විස්තර කරන්න. (ලකුණු 04)

(4) රාශිගත සංවරණයෙහි හා විකල්ප සංවරණයෙහි වෙනස්කම් පැහැදිලි කරන්න. (ලකුණු 06)

(7). (1) නව යොවුන් වියෙහි චිත්තවේග වර්ධනයේ ස්වභාවය පිළිබඳව ඔබේ අදහස් දක්වන්න. (ලකුණු 03)

(2) නව යෞවනයා මුහුණදෙන පවුල හා සමාජය ආශ්‍රිත ගැටළු ඉදිරිපත් කරන්න. (ලකුණු 03)

(3) “සන්නිවේදන මාධ්‍ය යෞවනයින් තුළ ගැටළු ඇති කිරීමට හේතුවිය හැකිය” විමසන්න. (ලකුණු 05)

(4) යොවුන් දරුවන්ගේ පෞරුෂ වර්ධනය සඳහා පාසලෙහි දායකත්වය සාකච්ඡා කරන්න. (ලකුණු 05)

(8). පහත දැක්වෙන මාතෘකා අතුරෙන් හතරක් පිළිබඳව ලියන්න.

(1) නිර්මාණකරණයේ මූලිකාංගයක් වූ රේඛා

(2) ආහාර වේලකට ධාන්‍ය හා ධාන්‍ය නිෂ්පාදන ඇතුළත් කිරීමෙහි වැදගත්කම.

(3) රෙදි මතුපිට මෝස්තර ගැන්වීම සඳහා ගැටපඩු කිරීම.

(4) නිවසෙහි විදුලිය පරිහරණයේ දී අනුගමනය කළ යුතු ආරක්ෂක පූර්වෝපායයන්.

(5) මානසික සමබරතාවය තුළින් යෞවනයාට සැලසෙන වාසි.

(එකකට ලකුණු 04 යි)

(මුළු ලකුණු 16 යි)

PAST PAPERS WIKI

(8) WWW.PastPapers.WiKi (8)

Downloaded from Past Papers Wiki - Most Extensive Wikipedia of Past Papers!


PARCEL NO
LOL.lk
BookStore
විභාග ඉලක්ක
පහසුවෙන් ජයගන්න
ඕනෑම පොතක් ඉක්මනින්
නිවසටම ගෙන්වා ගන්න
කෙටි සටහන් | පසුගිය ප්‍රශ්න පත්‍ර | වැඩ පොත් සඟරා | O/L ප්‍රශ්න පත්‍ර |
A/L ප්‍රශ්න පත්‍ර | අනුමාන ප්‍රශ්න පත්‍ර | අතිරේක කියවීම් පොත් |
School Book ගුරු අතපොත්
PADANAMA PUBLICATION
pesuru Prakashana Private Ltd.
Akura Pilot
සමනල දැනුම
T
සතර
පෙර පාසලේ සිට උසස් පෙළ දක්වා සියළුම ප්‍රශ්න පත්‍ර,
කෙටි සටහන්, වැඩ පොත්, අතිරේක කියවීම් පොත්, සඟරා
සිංහල සහ ඉංග්‍රීසි මාධ්‍යයෙන් ගෙදරටම ගෙන්වා ගැනීමට
www.LOL.lk වෙබ් අඩවිය වෙත යන්න